ආරම්භය: 1945 -09-30 ලි.ප. අංකය: කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසලොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව

බෞද්ධෝදය

"ධම්මො හවේ රකඛති ධමමචාරි"



71 වර්ෂය - ශ්‍රී බු.ව 2559 2016 පෙබරවාරි 22 නවම් කලාපය

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# මව් ගුණ නොදත් දරු වසලෙකු වන අයුරු
# බුදු හිමි දෙසා ඇත පියෙකුගෙ ගුණ මහරු

## (මව්පිය වරුණ අංක 02 කොටස)

කුස හෝනා දරුවා කෙබඳු කෙනෙක් දැයි සමහර විට මව්වරුන්ට ඇතිවන දොළදුකින් පවා කිය හැකි වේ. බිම්සර රජතුමාට දව එම දේවිය කුස පිළිසඳ ගත් දරුවා නිසා ඇට ඇතිවූ දොළදුකින් කුස හෝනා පුතු පියාණන්ට සතුරෙකු වන බව නිමිති දන්නෝ කිහ. එහෙයින්ම පුතු හට **"අජාතසත්තු"** යන නම් තැබූහ. පිය රජතුමාට ද්‍රෝහියෙකු වන බව දත් මව්තොමෝ දරුවා කුසදිම මරවන්ට සිතුවාය. එහෙත් පිය රජතුමා එය වැළැක් විය. උපන් පසුද දරුවා මරවන්නට මැණියෝ සිතූහ. එයටද අවසරයක් නොදි සොඳුර ! ඔබ කුස උපන් දරුවා මට දව උපන් බැවින් ඔහු ගෙන් මැරුම් කැවත් හොඳ යයි ප්‍රකාශ කොට හොඳින් හදන්ට යයි අවවාද කෙළේය.

දරුවා කුඩා වියෙහි දි ඔහුගේ ඇඟිල්ලෙහි ගෙඩියක් හට ගෙන වේදනාවෙන් හඬනා කල කිසිවෙකුටත් නැලවිය නොහැකි විය. එවිට සිහසුනෙහි සිටි පිය රජුන්ට දරුවා හඬන ශබ්දය ඇසී වහා දුවවිත් දරුවා උකුලට ගෙන මුව සිඟිත්ත සිඹ නලවා ගෙඩිය සහිත ඇඟිල්ල මුව තුල ලා ඉරුවේය. ගෙඩිය පුපුරා **ලේ සහිත සැරව මුව තුලට වන්හ. සෙනෙහැති පියතුමා කිසිදු කැතක් නොසිතා එම සැරව පවා ගිල්ලේය.**

එසේ හැදු වැඩු පුතු වැඩිවියට පත්ව දෙව්දත් තෙරුන්ගේ දුෂ්ට වචන අසා රාජ්‍ය ලෝභයෙන් පියා මරණට තැත් කළේය. එයින් කෝප නොවී පුතු හට රාජ්‍යයද පාවා දුන්හ.

කෙතෙක් කරුණාවෙන් වැඩ කළ ද, දුෂ්ට පුතා පියතුමා ගේ පතුල් පලවා ලුණු ගොරකා දමා, සිරගෙහි ලා, කෑම නොදෙවා මරවන ලදී. එහෙත් පියතුමා පුතු කෙරෙහි ප්‍රේමය මඳක් මුත් අඩු නොකළේය. පියවරුන්ගේ ප්‍රේමය කොතෙක් දැයි මෙයින් තේරුම් ගත හැක.

මෙතරම් ප්‍රේම කරන මවුපියනට කොපමණ කෙලෙහි ගුණ සලකා උවටැන් කලත් ප්‍රමාණ නොවන්නේය. එහෙත් යමෙක් ශ්‍රද්ධාව නැති මව්පියන් ශ්‍රද්ධා සම්පත්තියෙහි පිහිටුවද්ද, දුශ්ශීල මව්පියන් ශීල සම්පත්තියෙහි පිහිටුවද්ද, අඥාණ මව්පියන් ප්‍රඥා සම්පත්තියෙහි පිහිටුවද්ද, මේ ආදි වශයෙන් මෙවැනි ගුණ ධර්මයන්හි පිහිටුවා නම් එතකින් මවුපියනට ප්‍රත්‍යුපකාර කරන ලද්දේ නම් වේයයි බුදුරජාණන් වහන්සේ විසින් වදාරා තිබේ.

වර්තමාන බොහෝ දෙනා මව්පියනට සැලකීම බොහෝ ලඝු කොට සලකති. නවීන ලෝකයෙහි තරුණ තරුණියෝ මවුපියනට උපස්ථාන කිරිම වැඳුම් පිඳුම් කිරිම නින්දාවක් ලජ්ජාවක් කොට සලකන බව පෙනේ.

අද සමහර දූ දරුවන් තම වයසක දෙමව්පියන් මහලු මඩම් වල, වැඩිහිටි නිවසවල නවතා අසරණ කොට ඇත. කුඩා කල මඩම්වල දමා තමන්ගේ කැත කුණු අත ගාමින් හැදූ වැඩූ දෙමාපියන් මහලු මඩම්වල දමා තම නිදහස පතන ගුණමකු දූ දරුවෝ ධර්ම ද්වීපයයි නම් ලත් මේ රටට ද කරන මහත් නිගාවකි.

**යො මාතරං වා පිතරං වා - ජින්නකං ගත යොබ්බනං**
**පහූ සන්තොන භරති - තං ජඤ්ඤා වසලො ඉති**

වයසින් දිරූ දුර්වල මව්පියන් කෙරෙහි තමනට ශක්තිය තිබියදී උවටැන් නොකෙරේද, ඔහු වසලෙකැයි වසල සූත්‍රයෙහි දී දේශනා කොට තිබේ.

මව්පියන්ගේ ගුණ සලකා ක්‍රියා කරන දූ පුතුන් කුඩා කල සිටම මව්පියන්ට සැලකීමට පුරුදු විය යුතුයි. දෙවන වරටත් යමක් කියන තුරු නොසිට පළමු වරටම කිදේ මුදුනෙන් පිළිගෙන කෙරෙමින් තම සුවච බව දක්වනු මැනවි. වෙසතුරු රජුගේ බොළඳ දරු දෙදෙනා පූජක බමුණාට බියෙන් පොකුණෙහි සැඟ වී සිටි නමුදු පියතුමා හඬගැසූ විට දෙවරක් කථා කරන තුරු සිටීම නොමැන වී සිතා වහා දුව ගොස් පා මුල වැඳ වැටුන බැව් පින්වත් දරුවාට මතක ඇත. උදේ සවස පන්සිල් ගෙන තෙරුවන් වැඳ ටික වෙලාවක් මෙත් බැවුම් වඩා මව්පියන්ගේ පාමුල දනින් වැඳීමට පුරුදු වන්න.

අප බෝසත් තේමිය කුමරුන් මව්පියන් නොපෙනි සිටියද මව්පියන් සිටින පැත්තට හැරි වැන්දේය. මව්පියන් ඉදිරිපිටත් නැති තැනත් නියම ගෞරවය දැක්වීමට පුරුදු විය යුතුයි. බොහෝ වෙහෙස දරා වියහියදම් කොට උගන්වා හැදූ මව්පියන්ගේ සිත රිදවීම සුදුසු දැයි කල්පනා කර බලනු මැනවි. නිසි වයසට පැමිණි කල නිදහස ලැබුණත් මව්පියන් නොවිමසා තම හිතුමතයේ කිසිම පොරොන්දුවකට නොබැඳිය යුතුය. දරුවන් කොපමණ උසස් වුවත් මව්පියනට පිටුපා ක්‍රියා කිරිම නොමැනවි.

ගැමුණු කුමාරයාට මව්පියන් වෙතින් ලැබුණු ආගමානුකූල අවවාද නිසා ශාසනයටත්, රටටත්, අමරණීය සේවයක් සිදුවිය. කුඩාකල සිටම කීකරුකම, හික්මීම. සදාචාරය ආත්ම ගෞරවය ආදී ගුණදම් වඩා සියතින්ම මවුපියනට උවටැන් කරනු මැනවී.

ලක්දිව විසූ **"අග්බෝ රජුගේ"** චරිතය ගැන සිහි කරන්න. මෙතුමා මහලු මැණියන් සියතින්ම නහවා සියතින්ම කවා පොවා මැණියන් සියතින්ම ඇඳෙහි හොවා තුන්වරක් පැදකුණු කොට පසඟ පිහිටුවා වඳියි. පෙර සිටි සිංහල රජවරු මව්පියනට සැලකූ හැටි මෙයින් තේරුම් ගෙන උදාර සිංහල චරිත ගැන සිත යොමා හොඳ මවක්, හොඳ පියෙක්, හොඳ පුතෙක්ද හොඳ දුවක්, හොඳ ශිෂ්‍යයෙක් වීමට සිතනු මැනවි. සමහර විට, නොදැනුවත්කම නිසා හෝ, වචනයකට ඇති, අර්ථය කෙබඳු දැයි නොසිතිම, නිසා හෝ, අපේ මව්පියන්ට, දරුවන් විසින්, දැන් අළුත් ක්‍රමයකට අමතන්ටද, පුරුදු වී සිටි.

එනම්. අම්මාට, අම්මී කියාද, තාත්තාට තාත්තී, කියාද, පුන්චි අම්මාට, පුංචි කියාද, අමතන්නේ මොන හේතුවක් නිසාදැයි නොදනිමි. ආර්‍ය්‍ය සිංහලයෝ මව්පියන්ට, එසේ ඇමතුවේ නැත. අර්‍ථ ශූන්‍ය වචන භාවිතය - භාෂාව කබල් කිරිමක්ද වේ.

ද්‍රවිඩ භාෂාවෙන් **"අම්මී"** යනු මිරිස්ගලට ව්‍යවහාර වන වචනයකි. **"මම්"** කියන්නේ ඉතාමත් පැරණි පිරිමිඩ් වශයෙන් හැගෙන මීණි කුණුවලටය. පුංචි අම්මාට පුංචි කියා ඇමතිම, පහත් පෙලේ පැවතුම් වල සංකේතයකි. ඇතැම් විට අක්කාට, අක්කී, කියන්ටත් තවත් නෑසබඳකම ඔස්සේ ඈත අතීතයේ සිට භාවිතා කල හොඳ වචන, විකෘති කර යොදන්ටත් පුරුදුවීම, සිංහලකමටත් බෞද්ධ කමටත් නොගැලපෙන, ඉතාමත් පහත් යෙදීමක් බව සිතා, පැරණි සිංහල ආර්‍ය්‍ය සිරිත් අනුගමනය කිරිමට තරයේම ඉටා ගත යුතුය. සමහර දූ දරුවෝ ඇති දැඩි වූ විට මහලු මව්පියෝ අමතක කොට නොසලකා හරිති. එය මනුෂ්‍ය ධර්‍මයක් නොවේ. තමන් හැදූ වැඩූ අසරණ මව්පියන් දුකසේ සිටිය දී තමා පමණක් සැප විඳින්නේ කෙසේ දැයි නිති මෙනෙහි කල යුතුය. බෞද්ධයකු විසින් නම්

**"මව්පියන් නො පුදන්නා තුණුරුවන් පුදන්නෙක් ද නොවේ." තෙරුවන් කෙරෙහි කොපමණ භක්තිය දක්වන්නෙක් වුවද මව්පියන් නො පුදන්නේ නම් ඔහු නියම බෞද්ධයෙක් නොවේ.** මව්පියන්ගේ අඩුපාඩුකම් දුර්වලකම් කොතෙකුත් ඇතිවන්නට පුළුවන. දරුවන් විසින් ඒවා ගණන් නොගෙන සිය යුතුකම් කොටස නොපිරිහෙලා ඉටු කල යුතුයි. යමෙක් හරි හැටි මව්පියන් පුදන්නේ නම් පස් ආකාරයකින් පිදිය යුතු බව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට තිබේ.